# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2239/37 - 2021 අගෝස්තු මස 05 වැනි බ්‍රහස්පතින්දා - 2021.08.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය*: BER/4/5/2/82.
*ඉඩම් අමාත්‍යාංශයේ අංකය*: 4-3/11/2019/H/25.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශ්‍යතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ/පරවශ්‍යතාවේ විස්තර*:-

බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 748 පොල්කොටුව ග්‍රාම නිලධාරි වසමේ, නල්ලහේන ගමේ පිහිටි සර්වෙයර් ජනරාල්ගේ මුලික පිඹුරු අංක ක. 4834 දරන මුලික පිඹුරේ කැබලි අංක 01 ලෙස පෙන්නුම් කරන මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර 0.0230ක් වූ පහත විස්තර කෙරෙන ඉඩම් කැබැල්ල :

**කැබලි අංක 01**

ඉඩමේ නම: ඉල්ලෙපෙරුමච්චියේවත්ත *නොහොත්* ඉලේපෙරුමාච්චියාවත්ත; විස්තරය: ගෙවත්ත, විවෘත මුඩුබිම; හිමිකම් කියන අය: පස්දුන් කෝරලේ ආරච්චිගේ කාංචනමාලා දේවි මුණසිංහ; ප්‍රමාණය: පර්චස් 9.1

*උතුරට* : ඩී. සුරන්ත සහ තවත් අය හිමිකම් කියන ඉල්ලෙපෙරුමච්චියේවත්ත *නොහොත්* ඉලේපෙරුමාච්චියාවත්ත ; *නැගෙනහිරට* : මු. පි. ඒ. 1071හි කැබලි අංක 01 (මාර්ග (ප්‍රාස) සහ 02 (දිසා රෝහල බේරුවල); දකුණට: මු. පි. ඒ. 1071හි කැබලි අංක 2 (දිසා රෝහල, බේරුවල); *බටහිරට*: ඩී. සුරන්ත සහ තවත් අය හිමිකම් කියන ඉල්ලෙපෙරුමච්චියේවත්ත *නොහොත්* ඉලේපෙරුමාච්චියාවත්ත ;

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2021 සැප්තැම්බර් මස 08 වැනි දින පෙ. ව. 10.00 ට බේරුවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2021 සැප්තැම්බර් මස 01 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශතාවය ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

එම්. රංජන් පී. පෙරේරා,
ප්‍රාදේශීය ලේකම්,
බේරුවල.

2021 ජූලි මස 19 වැනි දින,
බේරුවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය,

08-230